මගේ අංකය: **ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු - 2025**

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,**
**දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,**
**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,**

**<u>උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ/ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරි, වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2025</u>**

2024.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛනගත රජයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරි, වැඩසටහන් සහකාර, ගිණුම් සහකාර තනතුරුවල නිලධාරීන් හා වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) සම්පූර්ණ නොකළ ද විශේෂිත හේතූන් මත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් 2025 වර්ෂය සඳහා වු ස්ථානමාරු අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පල කර ඇති Specimen Form "A" **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** නිවැරදිව සම්පූර්ණ කර දී ඇති උපදෙස් අනුව පහත සඳහන් අදාළ විද්‍යුත් ලිපින වෙත **මෘදුපිටපත්** (Soft Copies) **<u>2024.08.02 දින හෝ ඊට පෙර</u>** ඊමේල් කර එවිය යුතු අතර දෘඩ පිටපත් (Hard Copies) **<u>2024.08.05 දින හෝ ඊට පෙර</u>** ඒ ඒ අධිකරණයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එක් එක් සේවාවන් අනුව (අධිකරණ ලිපිකරු සේවාව/අධිකරණ ලඝු ලේඛක සේවාව.....ආදී) නිවැරදිව පුරවා එක් ආවරණ ලිපියක් මඟින් ආකෘතිපත්‍ර බහාලන කවරයේ ඉහල වම් කෙලවරෙහි **"<u>පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථාන මාරු - 2025</u>"** වශයෙන් සඳහන් කර 'ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ - 12' යන ලිපිනයට එවිය යුතුය.

| අනු අංකය | තනතුර | ලිපි ගොනුව නම් කළ යුතු ආකාරය | එවිය යුතු විද්‍යුත් ලිපින |
|---|---|---|---|
| 1. | අධිකරණ රෙජිස්ට්‍රාර් | උදා:- Registrar – DC Colombo | regi.antr@jsc.gov.lk |
| 2. | අධිකරණ පවුල් උපදේශක | උදා:-FC – DC Colombo | fc.antr@jsc.gov.lk |
| 3. | සංවර්ධන නිලධාරී | උදා:-DO – DC Colombo | do.antr@jsc.gov.lk |
| 4. | අධිකරණ ලිපිකරු | උදා:-Clerk – DC Colombo | clerk.antr@jsc.gov.lk |
| 5. | අධිකරණ භාෂණ පරිවර්තක | උදා:-Interpreter – DC Colombo | inter.antr@jsc.gov.lk |
| 6. | අධිකරණ ලඝු ලේඛක | උදා:-Steno – DC Colombo | steno.antr@jsc.gov.lk |
| 7. | අධිකරණ යතුරු ලේඛක | උදා:-Typist – DC Colombo | typist.antr@jsc.gov.lk |
| 8. | අධිකරණ පොත් බැඳුම්කරු | උදා:-Book Binder – DC Colombo | binder.antr@jsc.gov.lk |

02. ඉහත පළමු වැනි ඡේදයේ සඳහන් පරිදි වර්ෂ හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නමුත් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන නිලධාරීන් සේවා අවශ්‍යතා මත පුරප්පාඩු පවතින අධිකරණවලට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කරන අතර, එවැනි නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා නැවත සලකා නොබැලීමට ද අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ස්ථානමාරු ඉල්ලා සිටීමේ දී නිලධාරීන් විසින් තම කැමැත්ත අනුව අනිවාර්යයෙන්ම ස්ථාන තුනක් (03 ක්) නම් කල යුතු අතර වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයන් ද නම් නොකළ යුතුය.

**<u>එනමුදු කොළඹ අලුත්කඩේ අධිකරණ සංකීර්ණය සහ ස්ථානමාරු සඳහා අවම ඉල්ලුමක් පවතින පොළොන්නරුව, පුත්තලම, නුවර එළිය, අම්පාර, වව්නියාව සහ මන්නාරම යන අධිකරණ සංකීර්ණවල අධිකරණයක සේවයේ නියුතු නිලධරයන්ට එම අධිකරණ සංකීර්ණයේ ම වෙනත් අධිකරණයක් නම් කිරීමට අවසර ඇත. කෙසේවෙතත්, ඉහත සඳහන් අධිකරණවලට ආසන්න අධිකරණවල සේවා අවශ්‍යතාවයන් ද සලකා බලා හැකිතාක් දුරට එම අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයකට ස්ථාන මාරු ලබා දීමට සලකා බලනු ඇත.</u>**

**<u>අයදුම් කලයුතු ආකාරය පිළිබඳ උදාහරණ</u> :-**

**<u>මාතර දිසා අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**

1. තංගල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගාල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
3. දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය

**<u>තෙල්දෙණිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**

1. මහනුවර අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගම්පොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
3. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය

ඒ අනුව ඉහත 03හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ස්ථානමාරු අයඳුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් විෂයෙහි ද ඉහත 02හි සඳහන් පරිදි කටයුතු කරනු ලැබිය හැකි බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

04. (අ) අධිකරණ ලිපිකරු, අධිකරණ ලඝු ලේඛක, අධිකරණ යතුරු ලේඛක සහ අධිකරණ පොත් බැඳුම්කරු යන තනතුරුවල නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් සඳහා ඇතැම් ප්‍රදේශවල ඇති වී ඇති අධික ඉල්ලුම සුවිශේෂී තත්ත්වයක් සේ සලකා බලා දීර්ඝ කාලයක් තම පදිංචි පළාතෙන් පිටත එනම් වසර 6කට වඩා සේවය කරන ලද හා 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් වලින් විශේෂිත කාණ්ඩය යටතේ තම පදිංචි පළාතෙන් පිටත පළාතකට ස්ථානමාරු කරන ලද නිලධරයන්ගේ ඉල්ලීම් (බරපතල රෝගී තත්වයන් හා සුවිශේෂී හේතූන් මත කරනු ලබන) සලකා බැලීම සඳහා ඉහත සඳහන් සාමාන්‍ය ස්ථාන මාරුවලට අමතරව පහත පරිදි විශේෂිත කාණ්ඩය යටතේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

## <u>විශේෂිත කාණ්ඩය යටතේ අයඳුම්පත් ඉදිරිපත් කළ යුතු නිලධරයන්;</u>

පහත දිස්ත්‍රික්ක/ පළාත තුළ (අදාළ වන පරිදි) ස්ථිර පදිංචි සහ 2024.12.31 දිනට **අවු: 55**ට අඩු (වර්තමාන සේවා ස්ථානය තුළ **වසර 04 සම්පූර්ණ නොකළ** ද) පහත තනතුරුවල නිලධරයන් මේ යටතේ අයඳුම්පත් යොමු කිරීම අනිවාර්යය වේ.

**4.1 අධිකරණ ලිපිකරු : (රත්නපුර/බදුල්ල දිස්ත්‍රික්ක තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

4.1.1 2024.12.31 දිනට රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, පැල්මඩුල්ල, බලංගොඩ යන අධිකරණයක/ අධිකරණවල වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන්,

4.1.2 2024.12.31 දිනට බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල, බණ්ඩාරවෙල, වැලිමඩ යන අධිකරණයක/ අධිකරණවල වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන්,

**4.2 අධිකරණ ලඝු ලේඛක : (දකුණු පළාත තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

2024.12.31 දිනට දකුණු පළාතේ ගාල්ල, මාතර, වලස්මුල්ල, දෙයියන්දර, තංගල්ල යන අධිකරණයක/ අධිකරණවල වසර 04ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන්

**4.3 අධිකරණ යතුරු ලේඛක: (දකුණු පළාත තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

2024.12.31 දිනට දකුණු පළාත තුළ පිහිටි අධිකරණයක/ අධිකරණවල වසර 04ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන්

**4.4 අධිකරණ පොත් බැඳුම්කරු: (රත්නපුර, බදුල්ල දිස්ත්‍රික්ක තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

2024.12.31 දිනට රත්නපුර හෝ බදුල්ල දිස්ත්‍රික්කය තුළම පිහිටි අධිකරණයක/ අධිකරණවල වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන්,

(ආ) ඉහත 4.1 සිට 4.4 ඡේදයන්හි සඳහන් කාණ්ඩ වලට අයත් සියලු නිලධරයන් ස්ථානමාරු අයඳුම්පත් ඉදිරිපත් කරනු ලබන බවට ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික විය යුතු ය.

(ඇ) ඉහත 4.1 සිට 4.4 ඡේදයන්හි සඳහන් කාණ්ඩ වලට අයත් ස්ථානමාරු අයඳුම්පත් ඉදිරිපත් නොකරන නිලධාරීන් සේවා අවශ්‍යතාව සහ පුරප්පාඩු සලකා බලා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටි අධිකරණයකට ස්ථානමාරු ලැබීමට යටත් වේ.

05. මෙම ලිපියේ උපදෙස් ප්‍රකාරව ස්ථාන මාරු අයදුම් කිරීමට නිලධාරීන් වග බලා ගත යුතු අතර ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථාන ලබාදීමට නොහැකි වන අවස්ථාවන්හි සේවා අවශ්‍යතාවය මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නියමිත සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

06. දැනට වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කරනු ලැබ සිටින නිලධාරීන් **ස්වකීය ස්ථිර සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පමණක්** ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

07. තම කලත්‍රයා හෝ ආසන්න ඥාතියෙක් දැනට අධිකරණවල සේවයේ නියුතුව හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටී නම් එවැනි කිසිඳු නිලධාරියෙකු කලත්‍රයා හෝ ආසන්න ඥාතියා සේවය කරන අධිකරණයටම හෝ නීතිඥ වෘත්තියේ යෙදී සිටින අධිකරණයට ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටිය යුතුය.

08. **ස්ථාන මාරු ලබාදීමේ පිළිවෙල**

වර්තමානයේ අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ උග්‍ර හිඟය හේතුවෙන් මානව සම්පත් කළමනාකරණය කර ගැනීමේ දී මතුවන ගැටලු සහගත තත්ත්වය මඟහරවා ගනිමින් අධිකරණ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දෙමින් හැකිතාක් දුරට නිලධාරීන්ගේ ඉල්ලීම් ද ඉටු කිරීමට හැකි වැඩ පිළිවෙලක් සලකා බලනු ලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 ජූලි මස 19 වෙනි දින,
කොළඹ -12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.